www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇප දීමේ යෝජනාව කොන්ග්‍රසය තුල පරාජයට පත් වීමත් සමග වෝල් වීදියේ කොටස් මිල කඩා වැටෙයි

## Stocks plunge on Wall Street as bailout fails in Congress

**සමාජවාදී සමානතා පක්ෂයේ උප ජනාධිපති අපේක්ෂක බිල් වැන් ඕකන් විසිනි**
**2008 සැප්තැම්බර් 30**

29 වන දින ප්‍රධාන බැංකු හා මූල්‍යායතනවලට ඇප දීමේ එක්සත් ජනපද ආන්ඩුවේ යෝජිත සැලැස්ම, නියෝජිත මන්ත්‍රී මන්ඩලය තුල පරාජයට පත් වීමත් සමග වෝල් වීදිය භීතියෙන් ඇලලී ගිය අතර, එය ඒකක වශයෙන් ගත් කල ඉතිහාසයේ ලොකුම එක් දින කඩාවැටීමට මුහුන පෑවේ ය.

ඩව් ජෝන්ස් කාර්මික දර්ශකය ඒකක 777 කින් නැත හොත් සියයට 7 කින් වැටුනි. නැස්ඩැක් සම්මිශ්‍රිත දර්ශකය සියයට 9 ඉක්මවූ අගයකින් ද, ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (එස්ඇන්ඩ්පී) 500 දර්ශකය සියට 8.8 කින් ද ඇද වැටුනු අතර, වෙලඳපොලවල මුලු අගයෙන් සියයට 9 ක වටිනාකමක් සහිත ඩොලර් ට්‍රිලියන 1.2 ක් ක්ෂනිකව අතුගෑවී ගියේ ය. මන්ත්‍රී මන්ඩල ඡන්ද විමසීමට පෙර සිට ම වෝල් වීදිය පහල බැසීමට පටන් ගෙන තිබුනු අතර ''ඇප දීම මන්ත්‍රී මන්ඩලයෙන් සම්මත වුවත් වෙලඳපොල බිඳ වැටෙමින් තිබේ'' යන මාධ්‍ය සිරස් තල දැක ගැනීමට ඉඩ තිබුනි.

යුරෝපය හා ආසියාව තුල ඇප දීම සම්මත වනු ඇතැයි පුලුල්ව පැතිර තිබූ උපකල්පනය මත, 29 වන දින සවස ඡන්දය විමසන තෙක්ම වෙලඳපොල ගනු දෙනු අත් හිටුවා තිබුන නමුත්, ගලවාගැනීමේ බිලියන 700යේ යෝජනාවේ ඉරනම කුමක් වුවත්, ඒ වන විටත් නය සිඳී යාම නිසා එක්සත් ජනපදයේත් ජාත්‍යන්තරවත් නව බැංකු බිඳ වැටීම් මාලාවක් පිලිබඳ භීතිය හමුවේ ක්ෂනික අලාභයන් වාර්තා වෙමින් තිබුනි. 29 වන දින එක්සත් ජනපද වෙලඳපොල විවෘත වීමටත් පෙර යුරෝපීය ආන්ඩුවලට හා මූල්‍යායතනවලට, ප්‍රධාන බැංකු තුනක් ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදුකිරීමට බලකෙරී තිබුනි.

බෙල්ජියම, නෙදර්ලන්තය හා ලක්සම්බර්ග් යන රටවල ආන්ඩු ෆෝර්ටිස් බැංකුවට ඩොලර් බිලියන 16 ක ඇප දීමේ වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක තල අතර, බ්‍රිතාන්‍යයේ ඉඩම් හිමියන්ට නය දෙන ලොකුම බැංකුව වන බ්‍රැඩ්ෆර්ඩ් බිංග්ලි ස්පාඤ්ඤයේ ලොකුම බැංකුව වන බැංකෝ සැන්ටැන්ඩර් විසින් මිලට ගත්තේ ය. ජර්මන් ආන්ඩුවට හා ප්‍රධාන බැංකුවලට, හයිපෝ රියල් එස්ටේට් හෝල්ඩිංග්ස් ඒජී යන දේපල ගනු දෙනුවලට හා පලාත් ආන්ඩුවලට නය පහසුකම් සපයන යුරෝපයේ ලොකුම බැංකුවේ බිඳ වැටීම වලක්වා ගැනීම සඳහා ඩොලර් බිලියන 51.2 ක නයක් සහිතව මැදිහත් වීමට බලකෙරුනි.

එක්සත් ජනපදයේ බැංකු නය පොලී අනුපාතිකයන් 25 වසරක පමන කාලයකින් මෙපිට ඉහල ම මට්ටම් කරා නැගුනේ, ප්‍රධාන සමාගම් වසා දැමීමට බලකෙරෙන අවස්ථාව දක්වා නය වෙලඳපොලවල් ග්‍රහනයට ගෙන ඇති බවට අනතුරු ඇඟවීම් පැතිර යාමත් සමඟ ය. කොන්ග්‍රසය ඇපදීමේ යෝජනා ප්‍රතික්ෂේප කිරීමට ප්‍රතිචාර දක්වමින් භාන්ඩාගාර ලේකම් පෝල්සන් ධවල මන්දිරයේ පිවිසුම් මාර්ගයෙහි සිට මෙසේ පැවසී ය.

''ලොව පුරා වෙලඳපොලවල් පීඩාවට පත්ව තිබෙන අතර, ඇමරිකාව පුරා ව්‍යාපාර විසින් තොග මිලට ගැනීමේ දී මෙන්ම වැටුප් බිල් ගෙවීමේදීත් පදනම්ව සිටින නය පහසුකම් හීනවී ගොසින්ය.''

තොග පිටින් දොට්ට දැමීම් හා ජීවන තත්වයන් තවදුරටත් කපා හැරීමට තුඩු දෙන අවපාතයේ අවතාරය එකසත් ජනපදය හා ලෝක ආර්ථිකය වසාගෙන සිටියි. කෙසේ වුව ද එවන් දුර්භාග්‍යයක් වැලැක්වීමට පෝල්සන්ගේ ඇපදීමේ යොජනා ක්‍රමයට හැකියාවක් ඇතැයි - ඒ පිලිබඳව මූල්‍ය වෙලඳපොලවලට පවා ඇත්තේ මඳ විශ්වාසයක් පමනක් බවට සාක්ෂි ඇත - විශ්වාස කිරීමට හේතුවක් ඇත්තේ නැත. යෝජනාවලියේ අරමුන මිලියන ගනන් වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන්ට පිලියම් යෙදීම නොව ඇමරිකානු මූල්‍ය ප්‍රභූවේ ඉහල ස්ථරයන්ගේ ලාභ පොදි ආරක්ෂා කිරීමයි.

ප්‍රධාන පක්ෂ දෙකේ නායකයන් විසින් හුවා දක්වනු ලබන යෝජනාවේ, නග්න පන්ති ස්වභාවය වොෂින්ටන් පෝස්ට් පත්‍රයේ තීරු රචක ස්ටීවන් පර්ල්ස්ටේන් මෙසේ ගෙනහැර දැක්වීය. යෝජනා ක්‍රමයට විරෝධය පාන අය පහත සඳහන් දේ සිහියට නඟා ගත යුතු බව ඔහු අවධාරනය කලේ ය. ''ලෝකය

පුරා ම ආන්ඩු මුදල් තොග නයට ගෙන මූල්‍ය පද්ධතියේ විශාල පදාසයන් ප්‍රතිව්‍යුහගත කිරීමට හැකිවන පරිදි කෙලින්ම ජනසතු කර, ප්‍රාග්ධනය සම්පාදනය කර, ප්‍රතිසංස්කරනය කර අර්බුදය මඟහැරී යන විට යලි පුද්ගලික අයිතියට පැවරීම, මෙවන් තත්වයන්ගෙන් ගොඩයාමට ඇති එකම ක්‍රමය බව අවබෝධ කර ගත යුතුය.''

වෙනත් වචනවලින් කිව හොත් ''මුදල් තොග'' ජනතාවගෙන් පැහැරගෙන විශාල කොටස් හිමිකරුවන්ගේ හා ආයෝජකයන්ගේ ධනය ආරක්ෂා කිරීමටත්, පසුව මෙම මූල්‍ය කතිපයාධිකාරීන් වෙතට පැවරීම සඳහා, ප්‍රධාන බැංකු ලාභදායක තත්වයට පත්වන තුරු ආන්ඩුවේ ග්‍රහනයෙහි තබාගත යුතු බවයි.

මෙය සැලැස්මක් ලෙස හැඳින්වීම පවා පැහැදිලිව ම නොමඟ යැවීමකි. මෙය වනාහි බදු ගෙවන්නන්ගේ බිලියන 700 කට අධික මුදල් සම්භාරයක් ගෝල්ඩ්මන් සැක්ස් හි හිටපු ප්‍රධානියා වන පෝල්සන් අතට පත් කිරීමේ තීන්දුවට නොවැඩි දෙයක් පමනි. වෝල් වීදියේ ඔහුගේ හිටපු සගයන්ගෙන් වටිනාකමක් නැති කඩදාසි වත්කම් තොග ඔහුගේ අභිමතය පරිදි මිලට ගැනීමට ඉඩ හැරීමක් පමනි. ඉතිහාසයේ මීට පෙර තනි එක්සත් ජනපද රාජ්‍ය නිලධාරියෙකුට මෙතරම් පුලුල් බලතල පැවරූ අවස්ථාවක් ඇත්තේ නැත.

ප්‍රධාන මූල්‍යායතනවල ගිනුම් ගතව ඇති නොවටිනා වත්කම් තොගය මෙම යෝජනාවට ඇතුලත් දැවැන්ත මුදල මෙන් කිහිප ගුනයකි. මෙම මුදල බොහෝ විශ්ලේෂකයන්ට අනුව ප්‍රථම වාරිකය පමනකි.

ආර්ථික අර්බුදයේ බරින් මිරිකී සිටින සාමාන්‍ය වැඩ කරන ජනතාව සඳහා කිසිදු සහනයක් නොසැපයෙන, ධනයේ විශ්මයජනක පරිවර්තනය මත සීමා පැනවීමකින් පවා තොර ඒ සියල්ල, බුෂ් පරිපාලනය වෙතින් උපුටාගන්නා ''සහනයන්'' ලෙස කොන්ග්‍රස් ඩිමොක්‍රටික් නායකයන් කරන හුවාදැක්වීම හුදෙක් ප්‍රදර්ශන සැරසිල්ලක් පමනි.

මෙම යෝජනාව පිටුපස පක්ෂ දෙකේම නායකයන්ගේ හා ඔවුන්ගේ ජනාධිපති අපේක්ෂකයන්ගේත් පෙල ගැසීම තිබියදීත්, ඒ කෙරෙහි පලවන ඉමහත් මහජන විරෝධය, අවසානයේ දී යෝජනාවේ පරාජයට හේතු විය. ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ දෙකේම සෑම කොන්ග්‍රස් අපේක්ෂකයෙක්ම පාහේ නොවැම්බර් මැතිවරන ජයග්‍රහනය සඳහා තියුනු තරඟයක යෙදී සිටින තත්වය තුල යෝජනාවට පක්ෂව ඡන්දය දීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාකයන් ගැන ඇති බිය නිසා ඊට විරුද්ධව ඡන්දය දුන්හ.

පරිපාලනය මෙන්ම කොන්ග්‍රස් නායකත්වයත් යෝජනාවලිය යලි සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන බව ඇඟවුම්කර ඇතත්, දෙවැනිවර ඡන්දය ඔක්තෝබර් දෙවෙනිදාට පෙර සිදු නොවන බව පෙනෙන්නට තිබේ.

ජනාධිපති ද, කොන්ග්‍රස් ඩිමොක්‍රටික් බහුතරයේ හා රිපබ්ලිකානු සුලුතරයේ නායකයන් ද, බරක් ඔබාමා හා ජෝන් මැකේන් ද පිටුබලය දුන් යෝජනාවලියේ පරාජයෙන් වෝල් වීදිය මෙන්ම ධවල මන්දිරය ද තිගැස්සී සිටිති.

යුක්රේන ජනාධිපති ද සමඟ ධවල මන්දිරයේ පෙනීසිටි ජෝර්ජ් බුෂ් වෙහෙසට පත් ස්වභාවයකින් කියා සිටියේ ''අප අති විශාල ගැටලුවකට මුහුනපා සිටින'' බවය.

ඇපදීම කෙරෙහි ඇමරිකානු ජනතාවගෙන් පලවන දැඩි විරුද්ධත්වය කෙරෙහි ඡන්දයෙන් පසුව වෝල් වීදියේ ප්‍රධාන මූල්‍යායතන වෙතින් පලවූයේ භීතිය මෙන්ම කෝපයයි. ඔවුන්ට තම ක්‍රෙඩිට් කාඩ් තවදුරටත් භාවිතා කල නොහැකි වීම හෝ මුදල් යන්ත්‍රවලින් සල්ලි ලබාගත නොහැකිවීම ගැන ''ඇස් ඇර බැලිය යුතු'' යයි සමහරු ජනතාව කෙරෙහි කෝපයෙන් සඳහන් කලහ.

ජනමාධ්‍ය සම්බන්ධයෙන් ගත්කල ඇත්ත ඇති සැටියෙන් වාර්තා කිරීම පසෙකට දමා තිබුනි. මූල්‍ය සමාගම්වල උත්සුකයන් හා කෝපය පිලිබිඹු කරමින් රූපවාහිනී නිවේදකයන් උත්සාහ කලේ, දියකර නොහැරිය පියවරක් පිලිබඳ අතාත්වික පරාජයක් ලෙස ජාත්‍යන්තරව ම පිලිගන්වා ඇති මතය බෙදා හදා ගැනීමටය.

ඇපදීම් යෝජනාවලිය කොන්ග්‍රස් ඩිමොක්‍රටිකයන්ගෙන් 238 ට 205 ක් ලෙස සියයට 60 ක් පක්ෂව ද, රිපබ්ලිකානුන් ගෙන් සියයට 67 ක් විරුද්ධව ඡන්දය දීමෙන් ද පරාජය විය.

යලි වතාවක් වෝල් වීදියේ වඩාත් ම නොවෙනස්වන හා පක්ෂපාතී ආරක්ෂකයන් ලෙසින් මතුව ආවේ ඩිමොක්‍රටිකයන් ය. ඔබාමා ඡන්දය පැවැත්වෙන දිනයේ දී කථා කරමින් සැලැස්ම අනුමත කරන මෙන් ඉල්ලා සිටියේ ය. සැලැස්මට ඇමරිකානු ජනතාවගේ සහාය ගොනු කරවීම සඳහා ඔවුන්ට කප්පම් තර්ජන එල්ල කිරීම අරමුනු කර ගෙන, ධවල මන්දිර තන පිටියේ හිඳ පැය ගනනකට පෙර ජෝර්ජ් බුෂ් කල ප්‍රකාශයන්ම ඔබාමා ප්‍රතිරාවය කලේ ය. ඔහු කියා සිටියේ ''ආර්ථික විනාශයක් වැලැක්වීම සඳහා අප සතු හොඳම හා එකම ක්‍රමය ඇපදීම'' බවය.

කෙසේ වුවත් ඔබාමාට හෝ වෙන කිසිවෙකුටත් මෙම යෝජනාවෙන් ඇමරිකානු

ජනතාවට සහන සැලසෙන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට නොහැකි විය. ඒ වෙනුවට යෝජනාවලිය නිසා ඔහු දී ඇති සොච්චම් මැතිවරන පොරොන්දු පවා කපාහැරීමට සිදුවන බවත් දැඩි මූල්‍ය විනයක අවශ්‍යතාවත් ඔබාමා දැනටමත් පිලිගෙන ඇත. මේ මඟින් අත්‍යවශ්‍ය සමාජ හා සෞඛ්‍ය රක්ෂන වැඩ සටහන්වලට නොවරදවා ම පහර වදිනු ඇත.

පනත පරාජය වීමෙන් පසුව පෝල්සන්ට කථාකරන තෙක් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීමෙන් ඔබාමා වැලකී සිටියේ ය. ඉන් පසු ඔහු යෝජනාව ගැන අවධාරනය කරමින් මෙසේ පැවසීය. ''මෙය වෙලඳපොලවල් ස්ථායී කිරීම සඳහා අපට අවශ්‍ය ය. අඩුම තරමින් අපට ඇති ක්ෂනික ගැටලු විසඳ ගැනීමටවත් හදිසි ගලවාගැනීමේ යෝජනාවලියක් පෙරට ගැනීමට වොෂින්ටනයේ සිටින ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් නියෝජිතයන් වග බලාගත යුතුය.''

මැකේන් ද තමාගේ පැත්තෙන් ඉක්මන් ප්‍රකාශයක් නොකලේ ය. ඒ අතරතුර ඔහුගේ මැතිවරන නියෝජිතයන් කොන්ග්‍රසයේ රිපබ්ලිකානු නායකත්වයේ හාස්‍ය ජනක ප්‍රකාශ පුනරුච්ඡාරනය කලහ. එනම් ඡන්දය විමසීමට මත්තෙන් කථානායක නැන්සි පෙලෝසිගේ ප්‍රකාශයෙන් එල්ල වූ දැඩි ප්‍රහාරයට ප්‍රතිචාර ලෙස යෝජනාව පරාජය වීමේ කථාවයි.

ඇපදීම කෙරෙහි කොන්ග්‍රසයෙන් පලවූ විරුද්ධත්වය ගලා ආවේ රටේ සුපිරි ධනපතියන් වෙත මහජන සම්පත්වල විශාල පදාසයන් මාරුකිරීමේ උත්සාහය ප්‍රකාශ කරන්නේ ''සමාජවාදය'' බව කියා සිටි රිපබ්ලිකන් පක්ෂයේ අන්ත දක්ෂිනාංශික කොටස් වලිනි.

මිචිගන්හි මන්ත්‍රී තේඩියස් මැක් කොටර් 1917 ඔක්තෝබරයේ රුසියානු විප්ලවයේ පිහිට පැතීම දක්වා දුර යමින් කියා සිටියේ ඇප දීමේ සැලැස්ම ''පාන්, සාමය හා ඉඩම් '' යන බොල්ශෙවික් සටන් පාඨය සිහිගන්වන බවයි.

අවමුඛ උකස්කරයන් පිලිබඳ වෝල් වීදියේ පරපුටු භාවයෙන් පැන නැගි අර්බුදය මඟින් අසමානුපාතිකව ගොදුරු කර ගත් සුලු ජාතික නිවාස ගැනුම්කරුවන්ට පහර ගැසීමේ වර්ගවාදී හඬතැලීම් පිලිබඳ බොහෝ සිදුවීම් තුලට මෙම දක්ෂිනාංශික දෘෂ්ටිවාදය කාවද්දා තිබේ.

මෙහි දී සිදුවූයේ ධනපතියන් සඳහා තව තවත් බදු කපාහැරීම, ඇමරිකාව තුල තවමත් සුලුවෙන් හෝ ඉතිරිව ඇති සමාජ ආරක්ෂන ජාලය විනාශකිරීම හා සියලු මහජන අරමුදල් මහා ව්‍යාපාරවලට මාරු කිරීම වැනි, ඇපදීමට විරුද්ධවූවන්ගේ ක්‍රියා මාර්ගයෙන් එකක් අවසානයේ දී වෙනත් මඟකින් ප්‍රකාශයට පත්වීම ය.

ඇපදීම කෙරෙහි ඇති මහජන විරුද්ධත්වය මෙම මෘග වාචාලයන්ට ගසාකෑමට හැකිවූයේ ඩිමොක්‍රටික් පක්ෂ නායකත්වය වැඩ කරන ජනතාවගේ උත්සුකයන් කෙරෙහි දක්වන නොතැකීම හා මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතාවන් පිටුපස ඔවුන් එකාවන්ව පෙලගැසී සිටින නිසාය. ඔවුහු වෝල් වීදියේ ඉල්ලීම්වලට සුලු හෝ විකල්පයක් ඉදිරිපත් කිරීමට තරයේ ම අසමත්ව සිටිති.

1930 ගනන්වල මහා අවපාතයෙන් පසුව ලෝක හා ඇමරිකානු ධනවාදය මුහුන දෙන ගැඹුරුම අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඇප දීම ප්‍රතික්ෂේප කිරීම පමනක් නොව වොෂින්ටනය පවත්වාගෙන යන විවාදයේ සමස්ත ආකෘතිය ම ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය ය. එමගින් නිර්මානය කෙරෙන සමාජ ව්‍යසනය විසඳීමේ ලා ධනේශ්වර පද්ධතිය මුලුමනින්ම අසාර්ථක වී තිබෙන අතර බුෂ්, පෝල්සන්, ඔබාමා හා අනෙකුත් අයගේ අනතුරු ඇඟවීම් සැක කිරීමට හේතුවක් නැත.

මෙම අර්බුදයට පිලිතුරක් සොයාගැනීමට පටන් ගත යුත්තේ මෙයට ගෙවන්නේ කවුරුන්ද? යන ප්‍රශ්නය ඇසීමෙනි. ඩිමොක්‍රටික් හා රිපබ්ලිකානුවන් අතර කුමන මතභේද පැවතිය ද, ඊට ඔවුන්ගේ පිලිතුර පැහැදිලි ය. ඒ, විනාශය නිර්මානය කල මූල්‍ය පරපුට්ටන් ගලවා ගැනීම සඳහා කම්කරු පන්තිය ඔවුන්ගේ රැකියා, ජීවන තත්වයන් හා සමාජ අවශ්‍යතාවන් කැපකල යුතුය යන ඔවුන්ගේ ආස්ථානයයි.

කම්කරු පන්තිය තමන්ගේ ම විසඳුම ඉදිරිපත් කල යුතුය. දැන් ආර්ථිකය පහලට ඇද දැමීමටත් දශ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් දුගී භාවයට ඇද හෙලීමටත් තර්ජනය කරන බැංකු හා මූල්‍යායතන, ඒවායේ විධායකයන්ට හා විශාල කොටස් හිමියන්ට වන්දි ගෙවීමකින් තොරව ජනසතු කල යුතුය.

ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය කරන ජනතා ව්‍යවසායන් බවට මෙම ආයතන පරිවර්තනය කරමින්, ඒවායේ සම්පත් ධනපතියන්ගේ ලාභ නිර්මානය කිරීම සඳහා නොව රැකියා බිහිකිරීම, නිවාසවලින් නෙරපා හැරීම හා අත් පත් කර ගැනීම් අවසන් කිරීම, සමාජ යටිතලය යලි ගොඩනගමින් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා හා අනෙකුත් මූලික අවශ්‍යතාවන් සඳහා සමාජ වැඩසටහන් ඇතුලු නිෂ්පාදන කාර්යයන් සඳහා යෙදවිය යුතුය.

මෙම අර්බුදයට කෙලින් ම වගකිවයුතු, තමන් සඳහා ඩොලර් දශ ලක්ෂ ගනන් වාසි ගෙන දුන් මූල්‍ය අවභාවිතයේ ප්‍රෝඩාකාරී රූපාකාරයන් නිර්මානය කල, වෝල් වීදියේ විධායකයන් වරද කරුවන් බවට පත් කල යුතු ය. ඔවුන්ට එරෙහිව අපරාධ චෝදනා එල්ල කල යුතු අතර ඔවුන්ගේ වත්කම් අත් පත් කර ගත යුතුය.

මෙම ක්‍රියාමාර්ගය සඳහා සටන්කල හැක්කේ වැඩ කරන ජනතාව ඔවුන්ගේ ම ස්වාධීන දේශපාලන පක්ෂය තුල රැලි කිරීමෙන් පමනි. මෙහි දී ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ විසින් ආරක්ෂා කරන මහා ව්‍යාපාර හා බැංකුවල දේශපාලන ග්‍රහනය හා පාලනය කම්කරුවන්ගේ ආන්ඩුවකින් විස්ථාපනය කල යුතුය. මෙම ප්‍රතිපත්තීන් සඳහා සටන් වදින සමාජවාදී සමානතා පක්ෂය හා එහි ජනාධිපති හා උප ජනාධිපති අපේක්ෂකයන් වන ජෙරෝම් වයිට් හා මම 2008 මැතිවරන ව්‍යාපාරයේ දී වැඩ කරන ජනතාවගේ, ශිෂ්‍යයන්ගේ හා තරුනයන්ගේ හැකි පුලුල් ම ප්‍රේක්ෂකත්වයක් කරා මේ පිලිවෙත ගෙනයාමට සම්බන්ධ වනු ඇත. සමාජවාදී විකල්පයක අවශ්‍යතාවය සැලකිල්ලට ගන්නා සියලු දෙනාගෙන් ම අප ඉල්ලා සිටින්නේ මෙම ව්‍යාපාරයට සහයෝගය දෙමින් සසපයට බැඳෙන ලෙස ය.

© www.wsws.org